වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය - **2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය" ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිළිබඳ පනතේ 22 (4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි අධිකාරියේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- අධිකාරිය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- අධිකාරිය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනතේ 35 වගන්තිය | අධිකාරියේ රැස්වීම් හා එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ අධිකාරියේ කටයුතු කළමනාකරණය සම්බන්ධ රීති සකස් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව රැස්වීම් සඳහා කාර්ය පටිපාටි සහ කටයුතු කළමනාකරණය සම්බන්ධ රීති සකස් කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය සහ 38 (2) වගන්තිය | ගණන් දීමේ නිලධාරී විසින් අධිකාරියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය. තවද එම පනතේ 38 (2) වගන්තිය අනුව සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් , එවැනි සමාලෝචනයක් සිදුකර එහි පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අධිකාරියේ මූල්‍ය පාලනය පිළිබඳ ඇගයීම් කර සමාලෝචන වාර්තා විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. මූල්‍ය පාලනය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ සමාලෝචනය කර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය අනුව හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 16 වගන්තිය | සේවා යෝජකයා විසින් නියමිත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) සඳහා දායක මුදල් නියමිත කාලසීමාව තුළ ගෙවිය යුතු වුවද සේවකයන් 08 ක් සඳහා 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය සඳහා සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් වෙනුවෙන් දායක මුදල් ගෙවා නොතිබුණි. | කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් අදාල ලේඛන සම්පූර්ණ කර සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය දැරීම ආරම්භ කරන ලද්දේ 2022 වර්ෂයේ ඔක්තෝබර් මස සිට වන බැවින් එදින සිට සේවක අර්ථසාධක හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් දැරීමට කටයුතු කර ඇත. | සේවක අර්ථසාධක අරමුදල් පනතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 , 4.2.3, 4.3.1 හා 4.3.2 ඡේද | අධිකාරිය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ද සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් සහ මුළු පිරිවැය ඇස්තමේන්තුවක්ද සකස් කර නොතිබුණි. | ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත වී තිබුණද ඊට අදාල බඳවා ගැනීම් සිදු කිරීමට අදාල ආයතන විසින් අවශ්‍ය අනුමැතින් නිසි පරිදි ලබා නොදීම මත ඇතිවූ කාර්යමණ්ඩල හිඟය මත සියලු පූර්ව සැලසුම් එලෙසම ඉටු කිරීමට අවකාශ ලැබී නොමැත. එසේ නමුත් මෙම වර්ෂය තුල සිදු කරන ලද සියලුම මිලදී ගැනීම් හා අනෙකුත් ප්‍රසම්පාදනයන් මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් සිදු කර ඇත. | අධිකාරිය විසින් ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් හඳුනාගෙන ඊට අදාල ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර වාර්ෂික ප්‍රසම්පාදන කාලසටහනක් සහ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.477,984 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභයක් රු. 477,984 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි කිසිදු වර්ධනයක් හෝ පිරිහීමක් නිරීක්ෂණය නොවීය. මෙහිදී භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම අධිකාරියේ සේවක වැටුප් ඇතුළු අනෙකුත් පරිපාලන වියදම් සඳහා දැරීමෙන් අනතුරුව නැවත භාණ්ඩාගාරයට ඉතිරි අග්‍රිම මුදල් ප්‍රේෂණය කරන බැවින් වත්කම් ක්ෂය වියදම පමණක් සමාලෝචිත වර්ෂය තුළ ඉතිරිවීම, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් පිළිවෙලින් රු.3,744,132 ක් හා රු.8,523,650 ක් විය. ඒ අනුව , පරිපාලන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.4,779,518 කින් එනම්

සියයට 127 කින් වැඩිවී තිබුණි. තවද, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වෙනත් වියදම් පිළිවෙලින් රු.34,092 ක් හා රු.99,674 ක් විය. ඒ අනුව වෙනත් වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.65,582 කින් එනම් සියයට 192 කින් වැඩිවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචන**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ පනතේ 4 වන වගන්තියේ සඳහන් අරමුණු සහ 6 වගන්තියේ කර්තව්‍යයන් අනුව වැවිලි කලාපවල කාර්යභාරයක් ඉටුකිරීමට අපේක්ෂා කළ ද, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම, කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම් සකස් කර අදාල ආයතන වෙත නියමිත කාල සීමාවන් තුළ ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබීම වැනි කරුණු මත ආයතනයෙන් අපේක්ෂිත කාර්යභාර්ය ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | අධිකාරිය සඳහා කාර්යමණ්ඩල බඳවා ගැනීමට අනුමැතිය 2019 වර්ෂය අගෝස්තු වන විටත්, බඳවා ගැනීමේ පටිපාටියට අනුමැතිය 2020 දෙසැම්බර් වන විටත් ලබාගෙන ඇත. ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය සියලු ඉල්ලීම් නිසි පරිදි ඉටු කර ඇත. ඒ අනුව අධිකාරිය විසින් ආයතනික මට්ටමින් ඒ සඳහා උපරිම උත්සාහයන් ගෙන ඇත. | අධිකාරියේ පනතේ අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය සම්පත් ලබාගැනීමට අවශ්‍ය සැලසුම් අනුමැතිය සඳහා නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කිරීමට හා පවතින සම්පත් ආයතනයේ අරමුණු ඉටුකරගැනීමට ඵලදායි ලෙස යොදාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 මාර්තු 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිකාරිය වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අංශයක් වශයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට නිර්දේශ කර තිබුණද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර මේ වන විටත් අංශයක් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සඳහන් කිරීමට කටයුතු කරමි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් 28 ක් පත් කළයුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විට වැඩ බැලීමේ පදනම මත අමාත්‍යාංශ නිලධාරීන් 07 ක් සහ කොන්ත්‍රාත් පදනම මත 07 දෙනෙකු බඳවාගෙන | ස්ථිර කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතින් ලබා නොදුන් බැවින් අධිකාරියෙන් අපේක්ෂිත විශාල කාර්යභාරය අවම මට්ටමකින් හෝ ඉටු කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ හා අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාව | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ අනුව එදිනට ආයතනය තුළ පුරප්පාඩු 28 ක් පැවතුණි. 2026 මැයි 31 දින වන විටද තනතුරු 03 ක් සඳහා ස්ථිර පත්වීම් 04 ක් පමණක් ලබාදී තිබුණි. | මත විකල්පමය ක්‍රියාමාර්ගයක් වශයෙන් අදාල කොන්ත්‍රාත් හා වැඩ බැලීමේ බඳවා ගැනීම් සිදු කර ඇත. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව දින 1,107 ක් ප්‍රමාදව එනම් 2026 මාර්තු 13 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | අධිකාරිය සතුව 2024 වර්ෂය දක්වා නිත්‍ය ගණකාධිවරයකු නොමැති වීම තුල 2019 සිට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනයන්ට විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**4.2 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 3.1 මාර්ගෝපදේශය හා සබැඳි ඇමුණුම III හි 4 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් මෙම අධිකාරිය ආරම්භ කළ 2019 | 2019 වාර්ෂික වාර්තාවද සමග 2020 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යතුමාගේ අනුමැතියට 2026 මැයි 27 දින ඉදිරිපත් කර ඇත. | මාර්ගෝපදේශ අනුව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

වර්ෂයෙන් පසු කිසිදු වාර්ෂික වාර්තාවක් විගණිත දින වූ 2026 මැයි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව 2022-2026 වර්ෂ සඳහා උපායමාර්ගික සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි උපායමාර්ගික සැලසුම් පිළියෙල කළ යුතුය. |

## 4.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක PFD/RED/01/04/2014/01 දරන 2014 පෙබරවාරි 17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයෙහි 2.3 වගන්තියෙහි ඇමුණුම I ප්‍රකාර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛයේ අවශ්‍යතා අනුව සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ රට තුල පැවැති අහිතකර ආර්ථික තත්වය තුල අධිකාරියේ සිටින ලද්දේ සීමිත කාර්ය මණ්ඩලයක් වීමත්, නිවසේ සිට රාජකාරි සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නිලධාරීන් සතු නොවීමත් තුල උපදෙස් දී ඇති සියලු තාක්ෂණික සැළසුම් සකස් කිරීමට අවස්ථාවක් නොමැති විය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඉදිරි වර්ෂයන්වලදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ වැවිලි ප්‍රජාව සඳහා හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම යටතේ ක්‍රියාකාරකම් 6ක් හඳුනාගෙන තිබූ අතර ප්‍රතිලාභීන් 600ක් හඳුනාගැනීම, ඉඩම්සීමා වටා මිනුම් සමීක්ෂණය සහ බිම්කොටස් ලකුණු කිරීමේ සමීක්ෂණ 514 සිදුකිරීම, ප්‍රතිලාභීන් තහවුරු කර ගැනීම හා අයදුම්පත් 514 ක් සම්පූර්ණ කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් ඔප්පු 290 ලබාගැනීම සහ භාරදීම ඉලක්කගත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඔප්පු භාරදීමේ ඉලක්කය සම්පූර්ණ කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙතින් අපේක්ෂා කරන ලද පරිදි ප්‍රතිපාදන නොලැබීම මත 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුලින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ අපේක්ෂා කරන ලද ඉලක්ක සපුරා ගැනීමට අපහසු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු හා ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ මහනුවර දිස්ත්‍රික්කයේ තිරසාර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 7.8 ක් වියදමින් කොන්ක්‍රීට් පාරවල් 13 ක් ඉදිකිරීමට සහ ප්‍රජා මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද ප්‍රජා මධ්‍යස්ථානය සංවර්ධනය කර නොතිබූ අතර කොන්ක්‍රීට් පාරවල් 05 ක්ද ඉදිකර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන අනුව කලමනාකරණය කරමින්, ව්‍යාපෘති ඇගයීම් කර ප්‍රමුඛතාව අනුව ව්‍යාපෘති 8 ක් ක්‍රියාත්මක කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු හා ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.5 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව මාස 03 කට වරක් රැස්විය යුතු වුවද අධිකාරිය විසින් 2022 සිට 2026 මැයි 21 දින දක්වා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අධිකාරියේ කාර්යයන් විගණනයට ලක්වන අතර තුන් මසකට වරක් අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සමාලෝචනයට ලක්වේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 4.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණු අතර ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු හඳුනාගත යුතු වුවද, අධිකාරිය විසින් අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන එම අරමුණු ලඟාකර ගැනීම සඳහා නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් නිශ්චිතව හඳුනාගෙන ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කිරීමට 2022 දෙසැම්බර් 31 දක්වා වසර 4 ක කාලය තුල අසමත් වී තිබුණි. | එකඟ වෙමි. මේ වනවිට ඊට අවශ්‍ය පියවර ගෙන ඇත. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව අධිකාරියේ අපේක්ෂිත අරමුණු , ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඊට අනුගතව කටයුතු කළ යුතුය. |